| විභාග අංකය : |
|---|
| |

# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි පළමු පරීක්ෂණය (බාහිර) - 2024

අප්‍රේල්/ මැයි - 2026

## BMGTE 1035 - ව්‍යාපාර ආර්ථික විද්‍යාව

කාලය : පැය 03 යි

<u>උපදෙස්:</u>

- මෙම ප්‍රශ්න පත්‍රය A කොටස, B කොටස සහ C කොටස යනුවෙන් කොටස් තුනකින් සමන්විතය.
- A කොටස අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 10 කින් සමන්විත වේ. එම ප්‍රශ්න සඳහා වඩාත්ම යෝග්‍ය පිළිතුර තෝරාගෙන එය මෙම පත්‍රයේ සටහන් කර, පිළිතුරු පත්‍රයට අමුණන්න.
- B කොටසෙහි හා C කොටසෙහි රචනා ශෛලියේ ප්‍රශ්න අටක් (08) ඇතුලත් වේ.
- B කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් (02) සහ C කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න එකක් (01) තෝරාගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
- ජංගම දුරකථන, ස්මාර්ට් පරිගණක හෝ වෙනත් අංකිත උපාංගයන් භාවිතා කිරීම තහනම් වේ.
- ගණක යන්ත්‍ර භාවිතයට ඉඩදෙනු ලැබේ.
- මුළු ලකුණු 100.

## <u>A කොටස</u>

1. පහත කුමක් සාර්ව ආර්ථික ස්ථායීකරණ ප්‍රතිපත්තියක් ලෙස හඳුන්විය හැකිද?

    අ) සමාගමක් තම නිෂ්පාදන වියදම් අඩු කිරීම.

    ආ) උද්ධමනය පාලනය කිරීමට රජය පොලී අනුපාත වැඩි කිරීම.

    ඇ) පාරිභෝගිකයෙකු උපරිම උපයෝගීතාවයක් ලබාගැනීම.

    ඈ) සමාගමක් උපරිම නිෂ්පාදන මට්ටම තීරණය කිරීම.

2. සූක්ෂමආර්ථික විද්‍යාව, සාර්වආර්ථික විද්‍යාවෙන් නිවැරදිව වෙන්කර හඳුනා ගන්නා ප්‍රකාශය කුමක්ද?

අ) සූක්ෂම ආර්ථික විද්‍යාව සමස්තයන් අධ්‍යයනය කරයි; සාර්ව ආර්ථික විද්‍යාව පුද්ගලයන් අධ්‍යයනය කරයි.

ආ) සූක්ෂම ආර්ථික විද්‍යාව මිල මට්ටම් කෙරෙහි අවධානය යොමු කරයි; සාර්ව ආර්ථික විද්‍යාව සමාගම් කෙරෙහි අවධානය යොමු කරයි.

ඇ) සූක්ෂම ආර්ථික විද්‍යාව පුද්ගල හැසිරීම් අධ්‍යයනය කරයි; සාර්ව ආර්ථික විද්‍යාව සමස්තයන් අධ්‍යයනය කරයි.

ඈ) වෙනසක් නැත.

3. දී ඇති ඉල්ලුම : Qd = 150 – 5P සහ සැපයුම Qs = 30 + 5P වන විට සමතුලිත මිල

අ) 10

ආ) 12

ඇ) 15

ඈ) 20

4. තේ සහ කෝපි අතර හරස් නම්‍යතාවය +1.5 වේ. මෙයින් ගම්‍ය වන්නේ:

අ) ඒවා අනුපූරක වේ.

ආ) ඒවා ආදේශක වේ.

ඇ) ඒවා බාල භාණ්ඩ වේ.

ඈ) ඒවා සම්බන්ධයක් නැත.

5. පාරිභෝගිකයෙකු උත්තල උපේක්ෂා වක්‍රයක් ඔස්සේ වමේ සිට දකුණට ගමන් කරයි. ආන්තික ආදේශන අනුපාතිකයේ (MRS) වෙනස නිවැරදිව පැහැදිලි කරන්නේ පහත සඳහන් ඒවායින් කුමක් ද?

අ) පාරිභෝගිකයා භාණ්ඩ දෙකෙන්ම වැඩි කැමැත්තක් දක්වන නිසා MRS වැඩි වේ.

ආ) පාරිභෝගිකයා අතිරේක X සඳහා Y අඩුවෙන් අත්හැරීමට කැමති නිසා MRS අඩු වේ.

ඇ) වක්‍රය දිගේ MRS නියතව පවතී.

ඈ) MRS ශුන්‍ය වේ.

6. සමාගමක් ප්‍රාග්ධනය ස්ථාවරව තබා ගනිමින් ශ්‍රම යෙදවුම වැඩි කරයි. යම් අවස්ථාවක දී, මුළු නිමැවුම අඩුවන අනුපාතයකින් වැඩි වේ. මෙය නිරූපණය කරන්නේ:

- අ) වැඩෙන පරිමනානුකූල ඵල
- ආ) ස්ථාවර පරිමනානුකූල ඵල
- ඇ) හීනවන ආන්තික ප්‍රතිලාභ
- ඈ) ඍණ ආන්තික ප්‍රතිලාභ

7. දිගු කාලීනව, පූර්ණ තරඟකාරී සමාගම්:

- අ) ධනාත්මක ආර්ථික ලාභයක් උපයයි.
- ආ) ශුන්‍ය ආර්ථික ලාභයක් උපයයි.
- ඇ) මිල සාදන්නන් වේ.
- ඈ) පහළට බෑවුම් වන ඉල්ලුමකට මුහුණ දෙයි.

8. ඒකාධිකාරී ඉල්ලුම: P = 120 – 2Q සහ පිරිවැය: TC = 20Q + 80

ලාභ උපරිම කරන නිමැවුම සහ මිල:

- අ) Q = 25, P = 70
- ආ) Q = 30, P = 60
- ඇ) Q = 20, P = 80
- ඈ) Q = 15, P = 90

9. දී ඇති පරිදි:C (පරිභෝජනය)= 400 + 0.8Y සහ I(ආයෝජනය) = 600, සමතුලිත ජාතික ආදායම:

- අ) 3000
- ආ) 4000
- ඇ) 5000
- ඈ) 6000

10. IS වක්‍රය පොලී අනුපාතය සහ ආදායමේ සංයෝජන පෙන්වයි, එහිදී:

- අ) මුදල් වෙළඳපොළ සමතුලිතතාවයේ පවතී.
- ආ) භාණ්ඩ වෙළඳපොළ සමතුලිතතාවයේ පවතී.
- ඇ) ශ්‍රම වෙළඳපොළ සමතුලිතතාවයේ පවතී.
- ඈ) උද්ධමනය ස්ථාවර වේ.

**(02 * 10 = මුළු ලකුණු 20)**

## B කොටස

**ප්‍රශ්න අංක 01**

අ) ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික වර්ධනයට අහිතකර ලෙස බලපාන වත්මන් ගෝලීය ආර්ථික වෙනස්කම් කෙටියෙන් පැහැදිලි කරන්න. මෙම වෙනස්කම් සමාගම්වල ව්‍යාපාරික ආර්ථික තීරණ විශේෂයෙන් පිරිවැය කළමනාකරණය, ඉල්ලුම පුරෝකථනය සහ උපායමාර්ගික සැලසුම්කරණය කෙරෙහි බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

ආ) තරගකාරී වෙළඳපොළක නිෂ්පාදනයක් සඳහා ඉල්ලුම සහ සැපයුම් ශ්‍රිත පහත පරිදි දක්වා ඇත:

$$Q_d = 200 - 5P$$

$$Q_s = 40 + 3P$$

මෙම නිෂ්පාදනය සඳහා සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය ගණනය කරන්න.

(ලකුණු 04)

ඇ) ධනවාදී, සමාජවාදී සහ මිශ්‍ර ආර්ථිකයන් යටතේ ක්‍රියාත්මක වන ආර්ථික පද්ධති සංසන්දනය කරන්න. ඔබේ පිළිතුරේදී, රජයේ කාර්යභාරය, මිලකරණ යාන්ත්‍රණය, පාරිභෝගික ස්වෛරීභාවය සහ අලෙවිකරණයේ අරමුණු මෙම ආර්ථික පද්ධති අතර වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න. අදාළ උදාහරණ සමඟ සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) "නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය (PPC) විශ්ලේෂණාත්මක රාමුවක් ලෙස භාවිතා කරමින්, හිඟකම, තේරීම, ආවස්ථික පිරිවැය යන මූලික ආර්ථික සංකල්ප විවේචනාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) මිල රු.200 සිට රු.250 දක්වා වෙනස් වන විට සහ ඉල්ලුම් ප්‍රමාණය 1000 සිට 800 දක්වා අඩු වන විට ඉල්ලුමේ මිල නම්‍යතාවය ගණනය කරන්න.

(ලකුණු 04)

ඇ) පාරිභෝගික ආදායම රු. 50,000 සිට රු. 60,000 දක්වා වැඩි වන විට සහ ඉල්ලුම් ප්‍රමාණය ඒකක 400 සිට ඒකක 520 දක්වා වැඩි වන විට ඉල්ලුමේ ආදායම් නම්‍යතාවය ගණනය කරන්න.

(ලකුණු 04)

ඈ) "නම්‍යතාව යනු ආර්ථික විද්‍යාවේ මූලික සංකල්පයක් වන අතර එය එක් විචල්‍යයක් තවත් විචල්‍යයක වෙනස්කම් වලට ප්‍රතිචාර දැක්වීමේ මට්ටම මනිනු ලබයි. ඉල්ලුම විශ්ලේෂණයේ දී, පාරිභෝගිකයින් මිල වෙනස්වීම් වලට ප්‍රතිචාර දක්වන ආකාරය තේරුම් ගැනීමේදී නම්‍යතාවය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරයි. ඉල්ලුමේ මිල නම්‍යතාවයේ ප්‍රධාන නිර්ණායක විවේචනාත්මකව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **03**

අ) පාරිභෝගික තෘප්තිය සහ තීරණ ගැනීම විශ්ලේෂණය කිරීමේ ප්‍රවේශයේදී සංඛ්‍යා සූචක උපයෝගිතා න්‍යාය සහ ක්‍රම සූචක උපයෝගිතා න්‍යායෙන් වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) ක්‍රම සූචක උපයෝගිතා න්‍යාය යටතේ උපේක්ෂා වක්‍රය සහ අයවැය රේඛා රාමුව භාවිතා කරමින්, තාර්කික පාරිභෝගිකයෙකු භාණ්ඩ දෙකක පරිභෝජනයේදී සමතුලිතතාවය ලබා ගන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 08)

ඇ) සම පිරිවැය වක්‍රයක (ISO - Quant) ලක්ෂණ මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **04**

අ) කුඩා බේකරියක් පිටි, උඳුන් සහ ශ්‍රමය භාවිතා කරමින් කේක් නිෂ්පාදනය කරයි. කෙටි කාලීනව, උඳුන් ගණන ස්ථාවර වේ, නමුත් නිෂ්පාදනය වැඩි කිරීම සඳහා බේකරියට වැඩි සේවකයින් බඳවා ගත හැකිය.

ප්‍රස්ථාර සටහන් භාවිතා කරමින්,

i) සේවකයින් සංඛ්‍යාව වැඩි වන විට කේක් වල මුළු ප්‍රතිදානය වෙනස් වන ආකාරය පැහැදිලි කරන්න.

ii) වැඩිවන, හීනවන සහ සෘණ ප්‍රතිලාභ කලාප හඳුනා ගන්න.

iii) උපරිම කාර්යක්ෂම නිෂ්පාදනය සඳහා ප්‍රශස්ත සේවක සංඛ්‍යාව දක්වන්න .

(ලකුණු 08)

ආ) පහත වගුවේ දැක්වෙන්නේ සමාගමක් සඳහා කෙටි කාලීන පිරිවැය දත්තවල අසම්පූර්ණ කට්ටලයකි. (i) සිට (vii) දක්වා ලේබල් කර ඇති අස්ථානගත අගයන් පුරවන්න.

| Quantity | TFC | AFC | TVC | AVC | TC | ATC | MC |
|---|---|---|---|---|---|---|---|
| 0 | 30 | | 0 | | | | |
| 1 | | | 20 | | | | (vi) |
| 2 | | | 35 | (iii) | (iv) | (v) | |
| 3 | | | 60 | | | | |
| 4 | (i) | | 85 | | | | |
| 5 | | (ii) | 115 | | | | (vii) |
| 6 | | | 150 | | | | |

කෙටි යෙදුම්:

- **TFC:** මුළු ස්ථාවර පිරිවැය
- **AFC:** සාමාන්‍ය ස්ථාවර පිරිවැය
- **TVC:** මුළු විචල්‍ය පිරිවැය
- **AVC:** සාමාන්‍ය විචල්‍ය පිරිවැය
- **TC:** මුළු පිරිවැය
- **ATC:** සාමාන්‍ය මුළු පිරිවැය
- **MC:** ආන්තික පිරිවැය

(ලකුණු 07)

ඇ) දිගු කාලීන සාමාන්‍ය පිරිවැය වක්‍රවල හැඩය තීරණය කිරීමට බලපාන සාධක මොනවාද?

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 05

අ) නිෂ්පාදනවල ස්වභාවය, විකුණුම්කරුවන් සංඛ්‍යාව, පිවිසුම් බාධක, මිල නියම කිරීමේ බලය සහ පවතින ආදේශක ප්‍රමාණය ඇතුළුව ඒකාධිකාරී වෙළඳපොළ ව්‍යුහයක ප්‍රධාන ලක්ෂණ විස්තර කරන්න. සැබෑ වෙළඳපොළවලින් සුදුසු උදාහරණ සපයන්න.

(ලකුණු 05)

ආ) කෙටි කාලීනව සහ දිගු කාලීනව, පූර්ණ තරඟකාරී සමාගමක් ලාභය උපරිම කරගන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. ඔබේ පිළිතුර, කෙටි කාලීනව සහ දිගු කාලීනව අදාල රූප සටහන් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) ඒකාධිකාරී ආයතනයක් පහත ඉල්ලුම් හා පිරිවැය සමීකරණයන්ට මුහුණ දේ.

$$P = 400 - 8Q$$

$$TC = 5Q^2 + 80Q$$

i) ලාභ උපරිමකරණ නිෂ්පාදන මට්ටම සහ මිල සොයන්න.

ii) ලාභය ගණනය කරන්න.

(ලකුණු 05)

ඈ) පූර්ණ තරඟකාරීත්වයක් යටතේ සමාගමක් මුහුණ දෙන ඉල්ලුම් වක්‍රය, ඒකාධිකාරය යටතේ ඇති සමාගමක ඉල්ලුම් වක්‍රය සමඟ සංසන්දනය කරන්න. මෙම ඉල්ලුම් වක්‍රයන් අතර බෑවුම සහ නම්‍යතාවයන් වෙනස් වන්නේ මන්දැයි පැහැදිලි කරන්න. ඔබේ පිළිතුරට සහාය වීමට රූප සටහන් භාවිතා කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**

## <u>C කොටස</u>

ප්‍රශ්න අංක 06

අ) ආර්ථිකයක ක්‍රියාකාරීත්වය අවබෝධ කර ගැනීමේදී සාර්වආර්ථික විද්‍යාවේ විෂය පථය සහ වැදගත්කම පැහැදිලි කරන්න. ජාතික ආදායම, මිල මට්ටම් සහ රැකියා මට්ටම් වැනි ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශක ආර්ථිකයක කාර්ය සාධනය තක්සේරු කිරීමට භාවිතා කළ හැකි ආකාරය සාකච්ඡා කරමින්, ශ්‍රී ලංකා සන්දර්භයට අදාළව උදාහරණ සපයන්න.

(ලකුණු 10)

ආ) "සාර්ව ආර්ථික අරමුණු (Macroeconomic objectives) ආර්ථික චක්‍රයේ (economic cycle) විවිධ අදියරයන් සමඟ සමීපව සම්බන්ධ වේ." ආර්ථික චක්‍රයේ විවිධ අදියරයන් වන විස්තාරණය (expansion), උච්චතම අවස්ථාව (peak), අවපාතය (recession), සහ අවම අවස්ථාව (trough) තුළ ආර්ථික වර්ධනය, මිල ස්ථාවරතාව, පූර්ණ රැකියා තත්ව, සහ ගෙවීම් ශේෂ ස්ථාවරතාව වැනි ප්‍රධාන සාර්ව ආර්ථික අරමුණු කෙසේ බලපෑමට ලක්වන්නේද යන්න සාකච්ඡා කරන්න. ඔබගේ පිළිතුර තුළ, මෙම වෙනස්කම් එක් එක් අදියරයේදී ව්‍යාපාර කාර්ය සාධනයට සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියට කෙසේ බලපාන්නේද යන්න විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **07**

අ) ජාතික ආදායම මැනීම ආර්ථිකයක් සඳහා වැදගත් වන්නේ මන්දැයි ප්‍රධාන හේතු තුනක් හඳුනාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) සුදුසු ආර්ථික තර්කනයක් සහ පැහැදිලිව නම් කරන ලද රූප සටහනක් භාවිතා කරමින්, අංශ තුනක ආර්ථිකයක ආදායම් චක්‍රීය ප්‍රවාහය ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න

(ලකුණු 06)

ඇ) **2025** වර්ෂය සඳහා උපකල්පිත ආර්ථිකයට අදාළ විස්තර පහත දැක්වේ:

පරිභෝජනය = **50+0.8Yd**

ආයෝජන = **100**

බදු = **20+0.2Y**

රජයේ වියදම = **250**

ලබා දී ඇති තොරතුරු වලින් නාමික දළ දේශීය නිෂ්පාදිතය (ජාතික ආදායම) ගණනය කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක **08**

අ) "භාණ්ඩ සහ සේවා වෙළඳපොළ සහ මුදල් වෙළඳපොළ අතර අන්තර් රඳා පැවැත්මක් පවතී." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) පහත සිදුවීම් සමතුලිත පොලී අනුපාතයට සහ ජාතික ආදායමට බලපාන ආකාරය IS – LM වක්‍ර භාවිතා කරමින් පැහැදිලි කරන්න.

i. රජය මූල්‍ය ප්‍රතිපත්ති ලිහිල් කිරීම.

ii. රජයේ වියදම් වැඩි කිරීම.

(ලකුණු 06)

ඇ) "පසුගිය වසර කිහිපය තුළ, ශ්‍රී ලංකාවේ ජනගහනයේ වයස් ව්‍යුහය සැලකිය යුතු වෙනසක් අත්විඳ ඇති අතර, ප්‍රතිපත්ති සම්පාදකයින් රටේ ජනගහනයේ වේගවත් වයස්ගත වීම ගැන සැබවින්ම කනස්සල්ලට පත්වනුයේ එය රටේ ආර්ථිකයට දැඩි ලෙස බරක් වන බැවිනි. වයස්ගත ජනගහනය ආර්ථිකයට යම් අහිතකර බලපෑම් ඇති කළද, එහි ධනාත්මක පැත්තක් ද ඇත". විරැකියාව පිළිබඳ සංකල්පය සහ විරැකියාවේ වත්මන් ප්‍රවණතා පැහැදිලි කරන්න

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**